## කොළඹ ඡන්ද සටන

# මගේ අරමුණ කොළඹ පරමාදර්ශී පුරයක් කිරීමයි

**මෙවර කොළඹ මහ නගර සභා ඡන්ද සටන තියුණුය. රජය මෙන්ම විපක්ෂය ද ලොකු සටනකට එළැඹ තිබේ. මේ ඡන්ද සටනේ රජය නියෝජනය කරන පුරපති අපේක්ෂක හිටපු අමාත්‍ය මිලින්ද මොරගොඩ මහතාගේ අදහස්වලට මෙම සටහන වෙන්වෙයි.**

**ප්‍රශ්නයː- මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය ආරම්භවෙලා දැන් සති දෙකක් වෙනවා. දිනෙන් දින මෝරන ප්‍රචාරක සටනේ දී ලැබෙන ප්‍රතිචාර කොහොමද?**

**පිළිතුරː-** ඉතා හොඳයි. මම හිතන්නෙ මේ වගේ ප්‍රචාරක ව්‍යාපාරයක දී අපේ වැඩිම අවධානය යොමු කරන්න ඕනැ ජනතා ප්‍රශ්න ගැනයි. කොළඹ ගත්තම බහුතරය සුළු ජාතික පිරිස්. මුස්ලිම් දෙමළ ජනතාව විශාල ලෙස ඉන්නවා. සිංහල සමාජයත් ඉතා ප්‍රබලයි. ප්‍රධාන ආගම් සියල්ලේම මිශ්‍රණයක් කොළඹ තිබෙනවා. කොළඹ නගර සීමාව තුළ වතු 1600ක විතර ඉන්න ජනතාවගෙන් බහුතරය දුප්පත්ම අය. මේ අයගෙ ජන ජීවිතය යහපත් වෙනසකට ලක්කිරීමයි අපේ අරමුණ. ඒ සඳහා අපි ඉදිරිපත් කළ සැලසුමට ඉහළ ජනතා ප්‍රතිචාරයක් තිබෙනවා. දුප්පත්ම හා මධ්‍යම පාන්තික කොටස්වලට ප්‍රමුඛත්වය දෙමින් සැම දෙනාගේම ප්‍රශ්න විසඳා දීමට අපේ සන්ධාන කණ්ඩායම කැපවෙනවා.

**ප්‍රශ්නයː- විපක්ෂය රජයට නගන ප්‍රධාන චෝදනාව කොළඹ ජනතාව කොළඹින් ඉවත් කරන්න යනවය කියන එකයි. එයින් අදහස් වෙන්නේ දැනට කොළඹ තිබෙන දුප්පත්කම - මුඩුක්කු පැල්පත් මේ විදියටම තියාගෙන දේශපාලනය කළ යුතු බවද? ඔබේ අදහස කුමක්ද?**

**පිළිතුරː-** පැහැදිලිව අපි කිව යුතුයි රජය ජනතාව කොළඹින් ඉවත් කරන්නෙ නැහැ. ඒක ජනාධිපතිතුමත් ආරක්ෂක ලේකම්තුමත් ඉතාමත් ඍජුව කියල තිබෙනවා. නමුත් කොළඹ ජනතාවගේ ප්‍රශ්න හිඟන්නාගෙ තුවාලයක් බවට පත්කරගෙන හැමදාම දේශපාලනය කරන්න බැහැ. අපි ඒ ජනතාව දුප්පත්කමෙන් අගහිඟකමින් මුදාගෙන වඩාත් හොඳ සමාජ තලයකට ගෙන ආ යුතුයි. ඒ සඳහා තමන් ඉන්න තැන්වලටම තට්ටු නිවාස ක්‍රම ඇතිකරනවා. කවුරුන් මොනවා කිව්වත් මේ සන්ධාන ආණ්ඩුව තව අවුරුදු 5ක් බලයේ ඉන්නවා. ඉතින් රජයේ සම්පත් ලබාගෙන කොළඹ දියුණු කරගන්න නම් විපක්ෂයට නගර සභාවෙ බලය දීල වැඩක් නැහැ. ඒක ජනතාව තේරුම් අරන් තිබෙනවා.

**ප්‍රශ්නයː- විපක්ෂයට ඔබ කියා තිබුණා කොළඹ ඡන්ද සටන දේශපාලන පාපන්දුවක් බවට පත්කරගන්න එපාය කියලා. ඇයි එහෙම කියන්නෙ?**

**පිළිතුරː-** විපක්ෂය කරන වරද තමයි තමන්ගෙ පක්ෂයේ ප්‍රශ්න, ජාතික ප්‍රශ්න, විසඳගන්න හදනව නගර සභා ඡන්දය මාර්ගයෙන්. ඒක වැරදියි. කොළඹ ජනතාවගෙ ප්‍රශ්න විසඳන්න කාටහරි වුවමනාවක් තිබෙනව නම් මහ ආණ්ඩුව එක්ක සහයෝගයෙන් වැඩකරන නගර සභාවක් පත් කළ යුතුයි. විපක්ෂය බලය ගත්තට තනි ගමනක් යන්න බැහැ. සම්පත් තිබෙන්නෙ මහ ආණ්ඩුවෙයි. ඒ නිසා කොළඹ මහ නගර සභාවට වරිපනම් බදු ගෙවන ජනතාවට සැබෑ වෙනසක් සංවර්ධනයක් අවශ්‍ය නම් එක්සත් ජනතා සන්ධානයට බලය දිය යුතුයි.

### රැකියා නැති තරුණ තරුණියන්ට පුරසවියෙන් මාසික දීමනාවක්

**ප්‍රශ්නයː- මැතිවරණ වේදිකාවේ රජය වෙනුවෙන් කතාකරන කථිකයන් ගණනාවක්ම කියා තිබුණ නිදහසින් පසුව වැඩිම කාලයක් කොළඹ නගර සභාව පාලනය කළ එක්සත් ජාතික පක්ෂය නිසා අද කොළඹ ජනතාව මුහුණ දෙන ප්‍රශ්න මෙතෙක් නොවිසඳීම ගැන ඔවුන් වගකිව යුතුය කියා. ඔබත් ඒ මතය දරනවාද?**

**පිළිතුරː-** චෝදනා කිරීම මගින්ම ඡන්ද දිනාගන්න මම අදහස් කරනවා නොවෙයි. නමුත් තිබෙන ප්‍රශ්න ගැන පැවති නගර සභාවලට වගකීමක් තිබෙනවා. එහෙම වුණත් පසුගිය අවුරුදු දෙක තුනේ විශේෂ කොමසාරිස් පාලනය යටතේ ආරක්ෂක ලේකම්තුමාගෙ මෙහෙයැවීමෙන් කොළඹ විශාල සංවර්ධන වැඩපිළිවෙළක් දියත් වුණා. ඒකට ඉතා හොඳ ජනතා ප්‍රතිචාර තිබෙනවා.

**ප්‍රශ්නයː- සමහරු කියනව නගරය ලස්සන කළාට ජනතාවගෙ දුක්ගිනි නිවෙන්නෙ නැහැ කියලා.**

**පිළිතුරː-** නගරය කැතට, අපවිත්‍රව, කුණු කසළ ගොඩගැහිල තිබුණාම ජනතාවගෙ දුක්ගිනි නිවෙනවද? ඒකයි මම කියන්නෙ අපි කතා කළ යුත්තෙ අපේ සැලැසුම් ගැන මිස පටු දේශපාලනය නොවන බව.

**ප්‍රශ්නයː- ඔබ එසේ කීවාට නගර සභාව කියන්නෙ දේශපාලන යාන්ත්‍රණයේම කොටසක්. අද ජනතාවගේ උපතේ සිට විපත දක්වාම දේශපාලනයෙන් තොරව යමක් කරගන්න පුළුවන්ද?**


**පිළිතුරː-** ජන ජීවිතයට දේශපාලනය තදින් සම්බන්ධයි. මම දන්නව ගෙයක ප්ලෑනක් පාස්කරගන්නත් අද නගර සභිකයකුගෙ සහාය ඕන. සමහරවිට අල්ලසකුත් දෙන්න වෙනවය කියලත් චෝදනා මතුවෙනවා. මේ ක්‍රම වෙනස් කළ යුතුයි. වැඩ ඉක්මන් කරන්න තාක්ෂණය පාවිච්චි කරන්න පුළුවනි. ලෝකෙ අනිත් රටවල මොබයිල් ෆෝන් එකෙන් බදු ගෙවන යුගයක් මේ. දැන් කොළඹ නගර සභාවෙ පාලන කාර්යාල 6ක් නොයෙක් තැන්වල තිබෙනවා. ඒ කාර්යාලවලටත් බලය බෙදල දීල ජනතාවට වඩාත් ඉක්මනින් පහසුවෙන් වැඩි කරදරයකින් තොරව සේවාව ලබා දෙන්නයි අපි සැලැසුම් කරල තිබෙන්නෙ. ඒක කරනහැටි මගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබෙනවා. කොළඹ පරමාදර්ශී නගරයක් කිරීමයි අපේ අරමුණ.

**ප්‍රශ්නයː- ජනාධිපතිවරයා ප්‍රමුඛව රජය කොළඹින් ජනතාව ඉවත් කරන්නට යනවායැයි විපක්ෂය නගන චෝදනාව ප්‍රතික්ෂේප කරමින් දිගින් දිගටම රජය ප්‍රකාශ නිකුත් කළා. ඒත් විපක්ෂය ඒ චෝදනාවම පුන පුනා කියමින් සමාජගත කරන්නට හදනවා. මෙය ඔබ තේරුම් ගන්නේ කෙසේද?**

**පිළිතුරː-** විපක්ෂයට සටන් පාඨත් හිඟ ඇතිනේ... මේ මගින් සිදුකරන්න හදන්නෙ ජනතාව බියට පත් කිරීමක්. සමහර තැන්වල ජාතිවාදී හා ආගම්වාදී ස්වරූපයෙනුත් මේ චෝදනාව මතුකරල තිබෙනවා. ඇතැම් අය කියනව කොළඹ ත්‍රීවිල් ඉවත්කරන්න යනවලු. සංවර්ධන ලොතරැයි කුඩු ඉවත් කරන්න යනවලු. පැහැදිලිවම මම කිව යුතුයි මේව බොරු ප්‍රචාර. මේ සියලු දෙනා කොළඹට අවශ්‍ය වැදගත් පුරවැසියො. ඒ කාගෙවත් රස්සාවලට හානිකරන්න රජය කිසිම විදියකින් හිතලවත් නැහැ. ත්‍රිරෝද රථ සේවාවක්, පත්තර විකිණීමත් සේවාවක්, ලොතරැයියත් කුඩා ව්‍යාපාරයක්. මේව කරන අය කිසි කෙනෙක් කිසිම තැනකින් ඉවත් කරන්නෙ නැහැ.

**ප්‍රශ්නයː- කොළඹ නගර සීමාවෙ වතු 1600ක් පමණ තිබෙන බව ඔබ කියනවා. මේ වතුවල තිබෙන ජනතා ප්‍රශ්න ඔබ හඳුනාගෙන තියෙනවද?**

**පිළිතුරː-** මම අවුරුදු 10ක් කොළඹ දේශපාලනය කළා. ඒ අය හා ප්‍රශ්න අපි දන්නවා. කුණු ඉවත් කිරීම, වැසිකිළි පහසුකම් හිඟය, දුප්පත්කම, තරුණ විරැකියාව, සොබා හා සමාජ ප්‍රශ්න රැසක් අපි විශේෂ සමීක්ෂණයකින් සොයාගත්තා. පසුගියදා මම උතුරු කොළඹ වැසිකිළි බලන්න ගියා. ඒව අබලන් වෙලා විනාශ වෙන්න යනව. ඒවා හදන්න ඕනැ. උතුරු කොළඹට අපද්‍රව්‍ය ඉවත් කරන පොම්පාගාර ඕනැ කරනව. අනිත් ප්‍රදේශවලත් ප්‍රශ්න එමටයි. මම ඒ සියල්ල හඳුනාගෙන තියෙනව.



එක්සත් ජනතා නිදහස් සන්ධානයේ කොළඹ පුරපති අපේක්ෂක
**මිලින්ද මොරගොඩ**

**ප්‍රශ්නයː- කොළඹ වෙසෙන දෙමළ මුස්ලිම් කතෝලික ක්‍රිස්තියානි ජන කොටස්වලට විශේෂ ප්‍රශ්න තිබෙනවා. ඒවා ගැන ඔබේ ප්‍රතිපත්තිමය විසඳුම කුමක්ද?**

**පිළිතුරː-** කොළඹ කියන්නෙ විවිධ ආගම් සංස්කෘති තිබෙන නගරයක්. මේ නගරය එකතු කරල සහජීවනය ගොඩනැගිය යුතුයි. ඒක මට කරන්න පුළුවනි. මුලින් කීව වගේ මගේ අරමුණ කොළඹ පරමාදර්ශී පුරයක් කිරීමයි. සියලු ආගම්වල ආගමික නායකයො මම මුණගැහුනා. ඒ අයගෙ අනුශාසනා මත ඔවුන්ගෙ ප්‍රශ්නවලට උත්තර සපයන්න අපි බලාපොරොත්තු වෙනව.

**ප්‍රශ්නයː- ඔබ කියා තිබුණ කොළඹ සිංගප්පූරුවක් කරනව කියල. කොළඹ සිංගප්පූරුවක් කළ යුතුද? කළ හැකිද? මේක ජනප්‍රිය සටන් පාඨයක් නේද?**

**පිළිතුරː-** කෙනෙකුට එහෙම කියන්නත් පුළුවනි. නමුත් යථාර්ථය ගන්න. සිංගප්පූරුවෙ සංවර්ධනය පටන් ගත්තෙ වතුවලින්. ඒ වතු සමාජවලට කිව්වෙ "කැම්පොන්" කියලයි. ඒ කාලෙ ලීක්වාන්යූ අගමැතිතුමාටත් විශාල අභියෝගයක් තිබුණා කොහොමද "කැම්පොන්"වල ඉඳල ජනතාව තට්ටු නිවාසවලට ගෙනියන්නෙ කියල. නමුත් ඔහු ජනතාවට කරුණු අවබෝධ කරදීල ඒ කටයුත්ත කළා. එතනින් තමයි සිංගප්පූරුවෙ දියුණුව පටන් ගන්නෙ. අපිත් හදන්නෙ දරිද්‍රතාවයෙ ගිලිල ඉන්න සමාජයට හරි මග පෙන්වා විමුක්තිය උදාකරන්නයි.

**ප්‍රශ්නයː- ඔබේ මැතිවරණ ප්‍රකාශනයෙ තිබෙනව කොළඹ තරුණ පිරිසගේ රැකියාව ඇතුළු ප්‍රශ්න විසඳීමේ වැඩ සටහනක් ගැන. කොළඹ තරුණයන්ට ඔබ කරන්නට යන්නේ කුමක්ද?**

**පිළිතුරː-** දැන් කොළඹ වතු ගනිමු. ඒවයේ කොයිතරම් දක්ෂ තරුණ තරුණියො ඉන්නවද... ඒ අයටයි අපි අවස්ථාව දෙන්න ඕනැ. මම මේ තරුණයන්ට "පුරසවිය" කියල විශේෂ වැඩසටහනක් මගින් අවස්ථා උදාකර දෙන්නට සූදානම්. එමගින් රැකියා විරහිත තරුණ තරුණියන්ට දීමනාවක් මාසිකව දෙන්න කටයුතු යොදා තියෙනව. එම දීමනාව මගින් ඔවුන්ට වෘත්තීය පුහුණුවක් ලබාගන්න පුළුවනි. ඒ වගේම ක්‍රීඩා සමාජයකට ඇතුල්වෙලා ලැබෙන ආධාර මුදල් උපයෝගී කරගෙන වෘත්තීය ක්‍රීඩකයෙක් වෙන්න පුළුවනි. මේ කටයුත්ත හරියට කෙරුනොත් තරුණයන්ට මාසික දීමනාවක් ලැබෙනව. වෘත්තික පුද්ගලයෙක් බිහිවෙනව. එයින් කුඩු උවදුර වගේ දේවලින් තරුණ සමාජය මිදෙනව.

**ප්‍රශ්නයː- මේ සඳහා සම්පත් හොයාගන්නෙ කෙසේද?**

**පිළිතුරː-** රජයෙන් කොටසක් ලැබේවි. මගේ සබඳතා හරහා විදේශීය තානාපති අංශ මාර්ගයෙන් තවත් ක්‍රමයකට මුදල් ලබාගන්න පුළුවනි. ප්‍රබල විදේශ රටවල් හා සංවිධාන මේ සඳහා අපට උදව් කරන්න දැනටමත් පොරොන්දුවී සිටිනවා. ඒ වගේම මේ රටේ කීර්තිමත් සමාගම්වලින් ද ආධාර කරන බව සහතික කර තියෙනව. ඒ ඔස්සේ නගර සභාවෙන් පාලනය වන අරමුදලක් හදලයි තරුණ සමාජයට දීමනාව ගෙවන්න යන්නේ නගරයේ කෙරෙන සමීක්ෂණයකින් මේ සඳහා තරුණ පිරිස් තෝරා ගන්නව.

**ප්‍රශ්නයː- ඔබ දින 100ක වැඩසටහනක් මගින් නගර සභාවේ සේවාව ආරම්භ කරන බව කියා තිබෙනවා. මොකද්ද මේ දින 100 වැඩසටහන තුළින් කරන්නෙ?**

**පිළිතුරː-** කාර්යක්ෂම යහ පාලනය ඇති කිරීමට මුල් තැන දෙනවා... ඉදිරියට නගර සභාව යන්න ඕන කඩිනමින් මහජන සේවා සපයන ආයතනයක් හැටියටයි. නගර සභාවෙ පාරිභෝගිකයො තමයි පුරවැසි ජනතාව. නාගරික මන්ත්‍රීවරුන්ගේ නියෝජනයටත් වැඩි වටිනාකමක් ලැබෙන්න කටයුතු කරනව. ජනතාව ගෙවන බදු මුදල්වලට මොකද්ද වෙන්නෙ? ටෙන්ඩර් ලබාදීම, කඩ බක්කි ලබා දීම වැනි කාරණා ගැන සියලු තොරතුරු විනිවිද භාවයෙන් යුතුව ජනතාවට ලබාදෙනව. නිවාස ප්ලෑනත් දින 30කින් පාස් කරන්න පවා අපි සැලසුම් කරල හමාරයි. මේ විධියට පළමු දින 100 තුළ ජනතාවට ඍජුවම බලපාන කාරණා 12ක් සඳහා මැදිහත්වී ඒ අංශ කාර්යක්ෂම කරනව.

**ප්‍රශ්නයː- එක්සත් ජනතා නිදහස් සන්ධාන අපේක්ෂකයා ලෙස සෙසු හවුල්කාර පක්ෂ ඔබට ලබා දෙන සහාය කවර ආකාරද?**

**පිළිතුරː-** ඉතාම ඉහළයි. මම නිතරම ජ්‍යෙෂ්ඨයන්ට ගරුකරන ඔවුන්ගේ උපදෙස් ගුරු හරුකම් ගන්න කෙනෙක්. ගරු ජනාධිපතිතුමා සන්ධාන මහලේකම් සුසිල් ප්‍රේමජයන්ත මහතා බැසිල් රාජපක්ෂ මහතා වගේ රජයේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන්, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහත්මයත් මට උපරිම සහාය දෙනවා. ජනාධිපතිතුමා දිනපතාම උපදෙස් දෙමින් ඡන්දය අධීක්ෂණය කරනවා. ඒ උදව් පදව් නිසා අපේ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයට විශාල ශක්තියක් හයියක් ලැබී තිබෙනව.

### හමුදාව සංවර්ධන කටයුතුවලට යොදාගැනීම වැරදිද?

**ප්‍රශ්නයː- ඔබට පෙනෙන ආකාරයට මෙම මැතිවරණයේ තිබෙන විශාලම අභියෝගය කුමක්ද?**

**පිළිතුරː-** කලකට පෙර මතයක් තිබුණ කොළඹ එක්සත් ජාතික පක්ෂයේ කඳවුරක්ද කියල. නමුත් දැන් ඒක යථාර්ථයක් නොවෙයි. පසුගිය මැතිවරණවල දී පැවති කඳවුරු බිඳවැටුණා. මේ මැතිවරණයේදී කොළඹත් සන්ධානය ජයගන්නව. විපක්ෂය මේ මැතිවරණ ව්‍යාපාරය තුළ තවමත් ප්‍රතිපත්තිමය විවාදයකට එන්නෙ නැහැ. ඒ නිසා මට විශාල අභියෝගයක් පෙනෙන්නෙ නැහැ.

**ප්‍රශ්නයː- මෙම මැතිවරණ සටන ඔබත් මුසම්මිල් මහත්මයත් අතර සටනක් වගේම මහින්ද රාජපක්ෂ හා රනිල් වික්‍රමසිංහ මහත්වරුන් අතර සටනක් ලෙසත් හඳුන්වන්න සමහරු උත්සාහ ගන්නව. පක්ෂ නායකයන්ම ප්‍රචාරක සටන මෙහෙයවන මෙම ඡන්දය ගලැඩ සටනක්ද?**

**පිළිතුරː-** කැමති විධියකට අර්ථකථනය කරන්නට පුළුවනි. නමුත් මම කියන්නෙ නැහැ මේ ජනාධිපතිතුමයි විපක්ෂ නායකතුමයි අතර සටනක්ය කියල. ජනතාව මෙහිදී බලන්න ඕන කොළඹ නගරයට හොඳම සේවාව කරන්න පුළුවන් කාටද කියන එකයි. ඒක කරන්න පුළුවන් ජනාධිපතිතුමා නායකත්වය දෙන සන්ධානය නියෝජනය කරන අපේ කණ්ඩායමටයි. ඒ නිසා ජනතාව අපට බලය දෙන බව සහතිකයි. විපක්ෂයට බලය ගියොත් ඒ අය සමහර විට මහ ආණ්ඩුව සමග ගැටුමට යයි. එවිට මහජන සේවාවක් ඉටුකරන්න ලැබේවිද කියන ප්‍රශ්නය මතුවෙනව. සංවර්ධනය පස්සට යාවි.

**ප්‍රශ්නයː- පසුගිය කාලයේ ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මහත්මය කොළඹ සංවර්ධනයට වැඩපිළිවෙළක් ගෙනිච්ච. ඔබ නගරාධිපති වුණොත් ඒ වැඩ පිළිවෙළ ඉදිරියටත් ගෙනියනවද?**

**පිළිතුරː-** ආරක්ෂක ලේකම්තුමත් මමත් කිට්ටු මිත්‍රයො හැටියට දැනට කෙරෙන වැඩපිළිවෙළ ගැන හොඳ අවබෝධයකින් ක්‍රියාකරනව. එතුමා ඉතාම කැපවීමෙන් නගරය ලස්සන කරනව. ඉදිරියටත් අපට එකතුවෙලා ජනතාවට සේවය කරන්න පුළුවනි.

**ප්‍රශ්නයː- ආරක්ෂක අමාත්‍යාංශය කොළඹ නගරය "මිලිටරීකරණය" කරන බවට විපක්ෂයෙන් චෝදනා නැගෙනව නේද?**

**පිළිතුරː-** ඕනම හොඳ වැඩක් කරන්න ගියාම ඔය වගේ දේවල් කියනව. යුද්ධයෙන් රට නිදහස් කර ගත්තට පස්සෙ ලක්ෂ ගණනක හමුදාව ජාතික සේවාවට කැඳවීම වැරදිද? ඒ අය කොළඹ නගරය සංවර්ධනය කරන්න ගෙනියන වැඩපිළිවෙළ කාගෙත් ප්‍රශංසාවට පාත්‍රවෙලා තිබෙනව. ආරක්ෂක අමාත්‍යාංශය යටතෙයි නාගරික සංවර්ධන අධිකාරිය තිබෙන්නෙ. ඉතින් හමුදාව නගර සංවර්ධන වැඩට දායක වෙනව. ඒ අය වරදක් කරල නැහැ. රට නිදහස් කරගන්න හමුදාව හොඳ නම් රට සංවර්ධනයට හමුදාව යෙදීම නරකද? ඒ නිසා ඔය නිෂ්ඵල සටන් පාඨවලට ජනතාව රැවටෙන එකක් නැහැ කියල මම හිතනව. කොළඹ මිලිටරිකරණය කරන්න රජයට අදහසක් තිබුණ නම් නගර සභා ඡන්දය නොතියා නාගරික අධිකාරිය හදල හමුදාවම යොදවල මේ කටයුතු කරන්න තිබුණා.

**ප්‍රශ්නයː- මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයේ මුල් කොටස ගෙවී හමාරයි. අප දන්නව රජය කොළඹ ඡන්ද හැසිරීම ගැන කිසියම් තක්සේරුවක් සමීක්ෂණයක් කළ බව. එහි තොරතුරු ඔබ සතුද?**

**පිළිතුරː-** අපේ සමීක්ෂණ වාර්තා ඉතාම පැහැදිලිව කියනව සන්ධාන කණ්ඩායම ජය ගන්නා බව. ඒ නිසා ඉතා ලොකු විශ්වාසයකින් අපි මේ මැතිවරණ සටන ගෙනියනව. ඒ වගේම අප ජයගන්නවා.

සංවාදය - **රන්ජිත් ආනන්ද ජයසිංහ**